## 20 වන සියවස මුල් දශකයේ ඉන්දියානු ජාතික කොන්ග්‍රසය

ඉන්දියානු ජාතික කොන්ග්‍රසයේ මධ්‍යස්ථ මතධාරීන් සහ සටන්කාමී නායකයන් අතර පැවති මත භේදය හේතු කොට ගෙන ක්‍රි.ව. 1907 දී ඉන්දියානු ජාතික කොන්ග්‍රසය දෙකට කැඩී ගියේ ය. මධ්‍යස්ථ මතධාරීන් කිරීටය යටතේ ඩොමීනියන් තත්ත්වයේ නිදහස ඉල්ලා සිටි අතර සටන්කාමී කණ්ඩායම කියා සිටියේ පූර්ණ නිදහස ලබා ගත යුතු බව ය. මේ මතභේදය පදනම් කොට ගනිමින් ඉන්දියානු ජාතික කොන්ග්‍රසය දෙකට බෙදී යාම ඉන්දියානු නිදහස් සටනට මුහුණ දීමට සිදු වූ අහිතකර තත්ත්වයක් විය.

බ්‍රිතාන්‍යයන් තම යටත් විජිත පාලනය කිරීමේ දී අනුගමනය කළ උපක්‍රමයක් වූයේ බෙදා පාලනය කිරීම යි. කුල භේදය, ආගම් භේදය, ජනවාර්ගික භේද, භාෂා අරගලය යන ඒවායින් ඕනෑම එකක් ඇවිස්සීමෙන් තම පාලනය පහසුවන බව බ්‍රිතාන්‍යයෝ දන සිටියහ. ඒ අනුව හින්දු- මුස්ලිම් භේදය ඇති කිරීමේ අභිලාෂයෙන් ක්‍රි.ව. 1906 දී බෙංගාලය දෙකට බෙදන ලදී. හින්දු - මුස්ලිම් භේදය වර්ධනය කිරීමට බෙංගාලය දෙකට බෙදූ කර්සන් සාමි ප්‍රකාශ කෙළේ එය පාලනය කිරීමට අපහසු විශාල ප්‍රදේශයක් බැවින් දෙකට බෙදන ලද බව යි.

ජාතික ව්‍යාපාරය ශක්තිමත් වෙමින් ඉදිරියට පැමිණෙන විට ඉන් බියට පත් වූ බ්‍රිතාන්‍යයෝ ජාතික ව්‍යාපාරය දෙකට බෙදීමට උත්සාහ කළහ. සුළුතර මුස්ලිම් ජනතාව දිනා ගැනීමට ප්‍රයත්න දැරූ බ්‍රිතාන්‍යයෝ මුස්ලිම් ජාතිකයන් ලවා ක්‍රි.ව. 1906 දී "මුස්ලිම් ලීගය" පිහිටු වූහ. ප්‍රධාන පෙළේ මුස්ලිම් නායකයකු වන සර් සයිද් ඛාන් කියා සිටියේ මුස්ලිම්වරුන් හින්දූන් සමඟ එකතු නොවී බ්‍රිතාන්‍යයන්ට පක්ෂපාතීව කටයුතු කළ යුතු බව යි.


## ඉන්දියානු ජාතික ව්‍යාපාරය හා මහත්මා ගාන්ධි

මෝහන්දාස් කරම්චන්ද් ගාන්ධි ක්‍රි.ව. 1869 ඔක්තෝබර් දෙවන දින ගුජරාටි ප්‍රාන්තයේ දී උපත ලැබී ය. ඉන්දියාවේ දී සාමාන්‍ය අධ්‍යාපනය ලැබූ ගාන්ධි එංගලන්තයට ගියේ බැරිස්ටර්වරයකුට අවශ්‍ය සුදුසුකම් ලබා ගැනීමට ය. එම සුදුසුකම් ලත් ගාන්ධි නීතිඥ වෘත්තීයේ කටයුතුවල නියැළීම සඳහා දකුණු අප්‍රිකාවේ නතාලයට ගියේ ය. එහි පැවති සුදු ජාතික රජය ස්වදේශිකයන්ට සලකන ආකාරය දුටු ගාන්ධි තම විරුද්ධත්වය පළ කෙළේ ය. ස්වදේශිකයන්ගේ අයිතිය රැක ගැනීම සඳහා "සත්‍යග්‍රහ" නැමැති නව ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පුරෝගාමී වූ ඔහු ක්‍රි.ව. 1915 දී යළි මවු රටට පැමිණියේ ය.

ඉන්දියාවට පැමිණි මහත්මා ගාන්ධි බ්‍රිතාන්‍ය යටත් විජිතවල කම්කරුවන් ලෙස සේවය කිරීම පිණිස ඉන්දියානුවන්ගෙන් ලබා ගෙන තිබූ පොරොන්දු පත්‍ර අවලංගු කිරීම සඳහා සත්‍යග්‍රහයක් පැවැත් වී ය. එහි ප්‍රතිඵල වශයෙන් පොරොන්දු පත්‍ර අවලංගු කිරීමට බ්‍රිතාන්‍යයෝ එකඟ වූහ. බෙංගාලයේ චම්පරාන් ප්‍රදේශයේ ඉන්ඩිගෝ වගා

කරන්නන්ගේ ප්‍රශ්නය විසඳුවේ ද සත්‍යග්‍රහයන් පැවැත්වීමෙනි. මෙසේ මහත්මා ගාන්ධි දුප්පත් පීඩිත ජනයාගේ විමුක්තිය ළඟා කොට දීම සඳහා කටයුතු කෙළේ ය. මෙතුමා මධ්‍යම පංතියේ විසිත්ත කාමර දේශපාලනය, දුගී පැල්පත් කරා ගෙන ගියේ ය.

මහත්මා ගාන්ධි ඉන්දියානු ජාතික කොන්ග්‍රසයේ සහාය ඇතිව සහයෝගිතා වර්ජන ව්‍යාපාරයක් (1920 - 1922) ආරම්භ කෙළේ ය. උසාවි, ව්‍යවස්ථාදායක මණ්ඩල, අධ්‍යාපන ආයතන හා බ්‍රිතාන්‍යයේ නිෂ්පාදිත භාණ්ඩ වර්ජනය කරන ලෙසත් බ්‍රිතාන්‍යයන් විසින් ප්‍රදානය කරන ලද තානාන්තර හා නම්බු නාම ඉවත දමන ලෙසත් ප්‍රභූන් දැනුවත් කෙළේ ය. සහයෝගීතා වර්ජන ව්‍යාපාරය රට පුරා සීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. මේ ව්‍යාපාරයේ සංවර්ධනාත්මක අංශය වූයේ දේශීය භාණ්ඩ පරිහරණය, කුල හීන සංකල්ප ප්‍රතික්ෂේප කිරීම, හින්දු මුස්ලිම් මිත්‍රත්වය යනාදිය යි. මේ ව්‍යාපාරය නිසා බ්‍රිතාන්‍ය පරිපාලනයට මුළුමනින් ම වාගේ බාධා ඇති විය. දැඩි අසීරුතාවකට මුහුණ දුන් බ්‍රිතාන්‍යය තමන්ට පුරුදු මර්දනකාරී ප්‍රතිපත්ති අනුගමනය කෙළේ ය. මලබාර් ප්‍රදේශයේ මොප්ලාවරුන්ගේ කැරැලි ආරම්භ වීම හා පන්ජාබයේ අතාලි ව්‍යාපාරය හේතු කොට ගෙන බ්‍රිතාන්‍යයන්ගේ තත්ත්වය තවත් දරුණු විය. මේ ව්‍යාපාරයේ යෙදුණු කණ්ඩායමක් උත්තර ප්‍රදේශයේ පොලිසියේ කිහිප දෙනකු මරණයට පත් කිරීම නිසා මහත් සංවේගයට පත් වූ ගාන්ධි එම ව්‍යාපාරය අවලංගු කර දැමීය. එයින් අධෛර්යයට පත් මෝතිලාල් නේරු හා සී.ආර් දාස් යන ගාන්ධිගේ අනුගාමිකයෝ ගාන්ධි අත්හැර ගොස් ස්වරාජ්‍ය පක්ෂය පිහිටුවා ගත්හ.




රූපය 3.6
මහත්මා ගාන්ධිතුමා

මහත්මා ගාන්ධිගේ ඊ ළඟ ක්‍රියාමාර්ගය වූයේ සිවිල් නීති කඩකිරීමේ ව්‍යාපාරය යි. එය ආරම්භ වන්නේ දණ්ඩි පාගමනෙනි. ලුණු බද්ද පිළිබඳ නීතිය කඩ කිරීම සඳහා සබරමතී ආශ්‍රමයේ සිට දණ්ඩි වෙරළ දක්වා ගිය මේ පාගමන සමස්ත ඉන්දියානු ජනතාව ආකර්ෂණය කොට ගැනීමට සමත් වී ය. රට පුරා ම එවැනි පාගමන් සංවිධානය කෙරිණි. දණ්ඩි පාගමනේ දී ගාන්ධි ඇතුළු දහස් ගණනක් සිර භාරයට ගැනිණි.

බ්‍රිතාන්‍ය ආණ්ඩුවට විරුද්ධව ක්‍රියාත්මක කරනු ලබන උද්ඝෝෂණ සමථයකට පත්කොට ගැනීමේ අරමුණ ඇතිව අර්වින් ප්‍රතිරාජයා සිරභාරයේ සිටි ගාන්ධි ගෙන්වා ගෙන ඔහු සමඟ සමථයකට එළඹිණි. ඒ අනුව සිරභාරයේ සිටි දේශපාලන සිරකරුවන් නිදහස් කෙරිණි. මහජන විරෝධයට පාත්‍ර වූ පනත් කීපයක් ඉවත් කර ගැනිණි. ඒ වෙනුවට ගාන්ධි සිවිල් නීති කඩ කිරීමේ ව්‍යාපාරය අත්හිටු වී ය.

ඉන්දියාවට නව ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා වූ දෙවන වට මේස සාකච්ඡාවට ගාන්ධිට ද ආරාධනා කරන ලදී. ලන්ඩන් නුවර සාකච්ඡාවට සහභාගී වූ ගාන්ධි ඉන්දියාවට ආපසු පැමිණියේ බ්‍රිතාන්‍යයන් ඉන්දියාවට

කිසිවිටක පූර්ණ නිදහස ලබා නොදෙන බව වටහා ගනිමිනි. තුන් වන වට මේස සාකච්ඡාව ද අසාර්ථක වූයේ කුල අනුව ආසන වෙන් කිරීමට යෝජනා වූ බැවිනි. අසාර්ථක වූ වට මේස සාකච්ඡා පදනම් කොට ගනිමින් ක්‍රි.ව. 1935 ඉන්දියානු පනත සකස් විය.



රූපය 3.7
මොහොමඩ් අලිජින්නා මහතා

ක්‍රි.ව. 1935 ඉන්දියානු ආණ්ඩුක්‍රම පනතින් සන්ධීය රාජ්‍යයක් බිහි කිරීම සඳහා පියවර ගෙන තිබුණ ද ඒ ව්‍යවස්ථාව සම්පාදනය කළ ආකාරය කෙරෙහි ඉන්දියානු ජාතික කොන්ග්‍රසයේ පැහැදීමක් නොවී ය.

ඉන්දියාවේ මුස්ලිම්වරුන්ට වෙන ම රාජ්‍යක් අවශ්‍ය බව කියන දර්ශනය මොහොමඩ් අලි ජින්නාගේ පිළිගැනීම විය. ඔහු මුස්ලිම්වරුන්ට වෙන ම නිජබිමක් ඉල්ලා සිටියේ ය. එම නිජබිමට පන්ජාබය, වයඹ දිග දේශ සීමා ප්‍රදේශ, කාශ්මීරය, සින්ඩ් යන ප්‍රදේශ අයිති විය යුතු බව යෝජනා කෙරිණි. මෙම නිජබිම පිළිබඳ ව අදහස මුලින් ම ඉදිරිපත් කරන ලද්දේ මොහොමඩ් ඉක්බාල් නමැති කවියා විසිනි.

දෙවන ලෝක මහා සංග්‍රාමය ආරම්භ වන විට ඉන්දියාව බ්‍රිතාන්‍යයන්ට පක්ෂපාති යැයි ඉන්දියාවේ ප්‍රතිරාජයා කළ ප්‍රකාශයට විරෝධය පෑ ඉන්දියානු කොන්ග්‍රසයේ ඇමති මණ්ඩලයේ ඇමතිවරු ඉල්ලා අස් වූහ.

ඉන්දියානු ප්‍රශ්නය හැකි ඉක්මනින් විසඳා ගැනීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සැලැස්මක් සමග සර් ස්ටැෆර්ඩ් ක්‍රිප්ස් ඉන්දියාවට එවන ලදී. යුද්ධයෙන් පසු ක්‍රියාත්මක කිරීමේ අපේක්ෂාවෙන් ඉදිරිපත් කළ පොරොන්දුවක ස්වභාවය දැරූ මේ ව්‍යවස්ථාව ගාන්ධි විසින් හඳුන්වන ලද්දේ ඉදිරි දිනයක් සඳහන් කළ චෙක්පතක් වශයෙනි. ක්‍රිප්ස් යෝජනා ජාතික ක්‍රොන්ග්‍රසය මෙන් ම මුස්ලිම් සංගමය ද ප්‍රතික්ෂේප කළහ. මුස්ලිම් සංගමය පාකිස්තානය නමින් වෙන ම රටක් ඉල්ලීය.

මේ තත්ත්වය යටතේ බ්‍රිතාන්‍යයන් ඉන්දියාවෙන් එලවා දැමීම සඳහා "ඉන්දියාවෙන් ඉවත් වෙනු" නම් ව්‍යාපාරය ගාන්ධි විසින් ආරම්භ කරන ලදී. මෙය මහත්මා ගාන්ධිගේ ප්‍රබලතම ව්‍යාපාරය විය.

මුස්ලිම්වරුන් සඳහා ශ්‍රීමත් රාජගෝපාලචාරි සැකසූ සැලැස්ම පිළිගන්නා ලෙස ගාන්ධි මොහොමඩ් අලි ජින්නාගෙන් කළ ඉල්ලීම ප්‍රතික්ෂේප විය. මොහොමඩ් අලි ජින්නාට අවශ්‍ය වූයේ තම යෝජනා අනුව පාකිස්තානය බිහි කිරීම යි. ඉන්දියානු ජාතික කොන්ග්‍රසය හා මුස්ලිම් සංගමය සමඟ එකඟතාවක් ඇති කිරීම සඳහා සිම්ලා සම්මේලනය සංවිධානය කළ ද එය මුළුමනින් ම අසාර්ථක විය.

ඉන්දියානු නිදහස් සටන පිළිබඳ කථා කිරීමේදී සුභාස් චන්ද්‍රබෝස්ට වැදගත් ස්ථානයක් හිමි වේ . ඉන්දියානු තැපැල් සේවයේ තනතුරක් දැරූ මොහු ඉන් ඉවත් වී ජාතික කොංග්‍රසයේ සාමාජිකත්වය ලබා ගත්ත ද එහි අදහස් තමාට නොගැළපෙන බැවින් ඉන් ඉවත් වී ප්‍රගතිශීලී පිළ ගොඩ නගා ගත්තේ ය. බ්‍රිතාන්‍යයන්ට එරෙහිව රහසේ සේනා සංවිධානය කළ ද එය බ්‍රිතාන්‍යයන්ගේ නිරීක්ෂණයට හසු වීම නිසා රටින් පලා යන්නට සිදු විය. ජපනුන්ට යටත්ව තිබූ බුරුමයට හා මලයාවට ගොස් සේනා සංවිධාන කෙළේ ය. එම සේනා යොදවා මානිපුර් හා ෂෙෂ්වර්පුර් ප්‍රදේශ ආක්‍රමණය කොට වර්ග සැතැපුම් 10,000 ක පමණ ප්‍රදේශ අල්ලා ගත්ත ද බ්‍රිතාන්‍ය සේනා අතින් පරාජයට පත් විය. චන්ද්‍රබෝස් ගුවන් අනතුරකින් මිය ගියේ ය.

ඉන්දියාවට නිදහස ලබා දීමට පොරොන්දු වූ කම්කරු පක්ෂය බ්‍රිතාන්‍යයේ බලයට පත් වූ අතර ක්‍රි.ව. 1946 ඉන්දියානු ප්‍රශ්නය විසඳීම සඳහා කැබිනට් දූත පිරිසක් ඉන්දියාවට එවන ලදී. ඒ වනවිට ඉන්දියාවේ මුස්ලිම්වරුන් සඳහා පකිස්තානය නමින් වෙනම රාජ්‍යයක් පිහිටුවීමේ යෝජනාව මොහොමඩ් අලි ජින්නා විසින් දැඩිව ඉදිරිපත් කොට තිබිණි. කැබිනට් දූත පිරිසේ යෝජනා අනුව පාකිස්තානය පිහිටුවීමේ යෝජනාව ප්‍රතික්ෂේප විය. ඒ අවස්ථාවේ සම්මත වූ යෝජනා අනුව බ්‍රිතාන්‍යයන් හා ඉන්දියාවේ රාජ කුමාරවරුන් සතු ව පැවති ප්‍රදේශ එකතු කොට එක්සත් ඉන්දියාවක් ගොඩ නඟා ප්‍රාන්තවලට ස්වයංපාලන බලතල ලබා දීමට යෝජනා විය. ආරක්ෂාව, විදේශ කටයුතු ප්‍රවාහනය හා ආදායම් පිළිබඳ කටයුතු මධ්‍යම ආණ්ඩුවේ විෂය පථයට හසු වූ ඒවා විය.

මෙමෙ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා තාවකාලික ආණ්ඩුවක් අවශ්‍ය විය. එසේ පිහිටුවනු ලබන තාවකාලික ආණ්ඩුවේ ඇමති මණ්ඩලයේ තනතුරු ලබා ගන්නා ලෙස මුස්ලිම් සංගමයට ආරාධනා කළ ද ඔවුහු එය ප්‍රතික්ෂේප කළහ. මේ තත්ත්වය නිසා ඉන්දියාව පුරා ම පාහේ ජාති භේදවාදී කැරැලි ඇති විය. ක්‍රි.ව. 1948 ජුනි මාසයට පෙර මේ ප්‍රශ්නය විසඳිය යුතු බව බ්‍රිතාන්‍ය අගමැති ක්ලෙමන්ට් ඇට්ලි සාමිවරයාගේ බලාපොරොත්තුව විය. එපරිද්දෙන් ව්‍යාකූල තත්ත්වයක් පැවති ඉන්දියාවේ ප්‍රතිරාජයා වශයෙන් මවුන්ට් බැටන් සාමිවරයා පත් කොට එවන ලදී. ඉන්දියාවේ දේශපාලන ගැටලුව විසඳීම සඳහා ඔහු සිය සැලැස්ම ඉදිරිපත් කෙළේ ය. මොහොමඩ් අලි ජින්නාගේ මුරණ්ඩු ක්‍රියාකලාපය නිසා ඉන්දියාව දෙකඩ වීම සිදුවන බව මවුන්ට් බැටන් සාමිවරයා කියා සිටියේ ය. ඒ අනුව ඉන්දියාව දෙකඩ විය. ක්‍රි.ව. 1947 අගෝස්තු 15 දින ඉන්දියාවට නිදහස ලැබිණි. ක්‍රි.ව. 1947 අගෝස්තු 14 දින පාකිස්තානය උපත ලැබී ය. 1950 ජනවාරි 26 දින සිට ඉන්දියාවේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක විය. එතැන් සිට ඉන්දියාව පරමාධිකාරී බලය සහිත ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයක් බවට පත් විය.

## ජපානය

ඉන්දියාවේ නිදහස් සටන් ව්‍යාපාරය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගත් අපි ඊළඟට ජපානය නූතන රාජ්‍යයක් බවට පරිවර්තනය වීමේ ඉතිහාස කථා පුවත අධ්‍යයනය කිරීමට යොමු වෙමු. 20 වැනි සියවසේ බලවත් රාජ්‍යයක් බවට පත් වූ ජපානයේ නැඟීම ආරම්භ වූයේ 17 වැනි සියවසේ ටොකුගාවාවරුන්ගේ පාලන සමයේ දී ය. අපි ඒ පිළිබඳ තොරතුරු ස්වල්පයක් අධ්‍යයනය කරමු.

## ටොකුගාවා ෂෝගුනේට්වරුන් යටතේ ජපානය

ජපානයේ වැඩවසම් යුගයේ කලහකාරි අවධිය 16 සියවස ආරම්භ වන විට එක්වර ම වාගේ නිමාවට පත් විය. සියවසක් පුරා පැවති වැඩවසම් යුද්ධ මාලාව ජය ගත්තේ එක් පරම්පරා කාලයක බිහි වූ පහත දැක්වෙන වීරයන් තිදෙනා විසිනි. මොවුන්ගේ කාලය ලේ වැගිරීම් ද අනුකම්පා විරහිත බවින් ද ද්‍රෝහි බවින් ද පිරී තිබුණ නමුත් ඔවුන් විසින් ජපානයේ දියුණුවට ඉමහත් කාර්ය භාරයක් ඉටු කොට ඇත.

නොබුනගා : මොහු කියෝතෝ ප්‍රදේශය අල්ලා ගෙන එහි සිටි පාලකයා එලවා දැමී ය. බෞද්ධ පන්සල් විනාශ කොට භික්ෂූන් දහස් ගණනින් මරා දැමී ය. ස්ත්‍රීන් හා ළමුන් දහස් ගණන් ජීවිතක්ෂයට පත් කෙළේ ය. ඔහු ක්‍රි.ව 1583 දී යුද පිටියේදී ම මරණයට පත් විය. එසේ වුවද ජපානය එක්සත් කිරීමටත් සාමය හා ස්ථාවරත්වය ගොඩ නැඟීමටත් පදනම දැමුවේ නොබුනගා විසිනි.

හිදෙයොෂි : නොබු නගරයේ ජෙනරාල්වරයා වන මොහු ජපාන ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම පුද්ගලයා වශයෙන් සැලකේ. උසස් බුද්ධි මට්ටම, නිවැරදි තීරණ ගැනීමේ හැකියාව යනාදී ගුණාංගවලින් යුක්ත මොහු අණ දෙන නිලධාරියෙකි. ජපාන යුද හමුදාවේ පහළම මට්ටමේ සිට එහි පාලකයා දක්වා උසස් වූ එක ම පුද්ගලයා මොහු ය.

ටොකුගාවා ඉයාෂු : කලක් නොබුනගාගේ ප්‍රවේණි දාසයකි. කැරැලිකරුවන් සමග සටන් කොට ඔවුන් සියලු දෙනා මර්දනය කොට 1603 ජපානයේ පාලකයා බවට පත් විය. නොබුනගා සහ හිදෙයොෂි යන දෙදෙනා ඉටු කළ කාර්යභාරයේ එල නෙලා ගත්තේ මොහු ය. ජපානයේ පැවති වැඩවසම් ආයතන ක්‍රමවත් කොට මධ්‍යම රජයට සහාය දිය හැකි ආයතන බවට පත් කළ ඉයාෂු තම පාලන කේන්ද්‍රස්ථානය වශයෙන් ඊඩෝ නගරය (දැන් ටෝකියෝ) තෝරා ගත්තේ ය. ආරක්ෂාව සඳහා එහි දිය අගලින් වට වූ දැවැන්ත බලකොටුවක් ඉදි කෙළේ ය. ශක්තිමත් මධ්‍යම රජය ආරක්ෂා කිරීම සඳහා මුළු රට පුරා ම විසිරී ගිය රහස් පොලිස් සේවාවක් ආරම්භ කළ ඔහු එමඟින් මධ්‍යම රජයට එරෙහිව සිදුවන

ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට විධිවිධාන යෙදී ය. සියවස් 2 1/2 ක් පමණ පැවතුණු ශක්තිමත් දේශපාලන රාමුවක් සකස් කෙළේ ටොකුගාවා ප්‍රධාන කොට ගත් ෂෝගුන්වරුන් විසිනි.

## ටොකුගාවා ෂෝගුන්වරුන් යටතේ පාලනය

ඉයාෂු යටතේ ආරම්භ වූ ටොකුගාවා පරම්පරාව ජපානයේ පාලන කටයුතු විධිමත් කිරීමට පියවර ගනු ලැබී ය. ඔවුන් යටතේ ද ජපාන ආණ්ඩුව ද්විත්ව පදනම මත ක්‍රියාත්මක විය. එනම් රාජකීය පවුල හා කියෝතෝ ප්‍රභූන්ගේ සභාව මඟිනි. බලය ඒකරාශි වී තිබුණේ ඊඩෝහි ටොකුගාවා ෂෝගුන්වරුන් වෙත ය.

තම පරම්පරාව වෙත පැවරී ඇති දේව කැමැත්ත මත තමන් රට පාලනය කරන බව ඔවුහු ජනතාවට ඇඟ වූහ. පාලකයන්ගේ පවිත්‍රතාව නිසා ඔවුන්ට කිසිදු හානියක් කළ නොහැකි බව කියන අදහස රට පුරා පැතිරවීමට උත්සාහ කළහ.

ටොකුගාවා පාලනයේ මුල් කාලයේදී එනම් 17 වැනි සියවස වන විට පෘතුගීසීහු හා ස්පාඤ්ඤවරු ජපානය සමග සැලකිය යුතු වෙළෙඳාමක් පවත්වාගෙන ගියහ. අනතුරුව ලන්දේසීහු ද පසුව බ්‍රිතාන්‍යයෝ ද මේ වෙළෙඳාමට සම්බන්ධ වූහ. ජපනුන් විසින් යුරෝපා ජාතීන් මහත් හරසරින් පිළිගන්නා ලද්දේ ඔවුන්ගෙන් ලබා ගත හැකි දේ බොහොමයක් තිබුණු බැවිනි.

### ටොකුගාවා යටතේ මිෂනාරි ව්‍යාප්තිය

යුරෝපීය වෙළෙන්දන් පසුපස ඊළඟට පැමිණියේ මිෂනාරීවරුන් ය. ජපන් ජාතිකයන් මිෂනාරීන් පිළිගත්තේ එතරම් සතුටකින් නොවේ. පෘතුගීසි ජේසුයිට්වරුන්ගේ හා ස්පාඤ්ඤ ප්‍රැන්සිස්කන්වරුන්ගේ දැඩි කැපවීම නිසා ජපානයේ සෑම පංතියකටම අයත් ජන කොටස් රෝමානු කතෝලික ආගම වැළඳ ගත්හ. දකුණු හා බටහිර ජපානයේ වෙළෙඳ මධ්‍යස්ථාන අවට සිටි බහුතර ජනතාව රෝමානු කතෝලික ධර්මය වැළඳ ගැනීම නිසා ක්‍රිස්තියානි ධර්මය තහනම් කළ යුතු යැයි ෂෝගුන්වරු සිතුහ. ආගන්තුක ආගම නිසා තම සංස්කෘතියට හානි පැමිණේ යයි ද රට දෙකඩ වී යාමට ඇති ප්‍රවණතාව වැඩිවේ යයි ද සිතූ ෂෝගුන්වරු පළමු වෙන් ම ක්‍රිස්තියානි ධර්මය වැළඳ ගත් ජපන් ජනතාවට අවවාද කළහ. මෙහි දී මිෂනාරීවරු විරුද්ධත්වය ප්‍රකාශ කළ අතර ආගම ප්‍රචාරය කිරීම දිගට ම කරගෙන ගියහ. එබැවින් මිෂනාරීන්ට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග අනුගමනය කළ ජපානයේ පාලකයෝ මිෂනාරීන් බොහෝ ගණනක් මරා දැමූහ. මේ අතර ක්‍රිස්තු ලබ්ධිකයෝ රජයට එරෙහිව කැරැලි ගැසූහ. ෂෝගුන්වරු කැරැලිකරුවන් සමූලඝාතනය කොට ක්‍රිස්තු ධර්මය මුළුමනින් ම ජපානයෙන් අතුගා දැමූහ.

## ටොකුගාවා අවධියේ ජපානය සහ යුරෝපීයයන් අතර පැවති සම්බන්ධතා

ක්‍රිස්තුභක්තිකයන් දරුණු ලෙස මර්දනය කිරීමෙන් පසු සියලු යුරෝපීයයන්ට ජපන් භූමිය තහනම් කිරීමට ෂෝගුන්වරු පියවර ගත්හ. ලන්දේසීන් දේශපාලන වශයෙන් අනතුරුදායක නොවේයයි සිතූ ටොකුගාවා පාලකයෝ වර්ෂයකට එක් නැවක් පමණක් ජපන් වරායකට ඇතුළු කිරීමට ඔවුන්ට අවසර දුන්හ. තම බලය යුරෝපීයයන්ට පෙන්වා දීමට ෂෝගන්වරු මෙය අවස්ථාවක් කොට ගත්හ. ඊට අමතරව ජපන් ජාතීන්ට විදේශ චාරිකා යෑම තහනම් කෙරිණි. තහනම ඉක්මවා කටයුතු කරන අයට දැඩි දඬුවම් විඳීමට සිදු විය. ජපන් මුහුදු සීමාවෙන් ඔබ්බට යාහැකි විශාල නෞකා තැනීම ද තහනම් විය. කෙසේ වුව ද චීනය සමඟ සබඳතා පෙර පරිදි පවත්වාගෙන ගියහ. ෂෝගුන්වරුන්ගේ මෙම ප්‍රතිපත්තිය නිසා ජපානය මුළුමනින් ම පාහේ හුදකලා රාජ්‍යයක් බවට පත් විය.

## ටොකුගාවා අවධියේ ජපානයේ දියුණුව

18 වැනි සියවස ආරම්භවන විට ජපානයේ ජන සංඛ්‍යාව මිලියන 30 ක් පමණ විය. ජනගහණ වර්ධන අනුපාතිකය ඉතා පහළ මට්ටමක පැවතිණි.

විදේශීය වාණිජ කටයුතු කපාහැර දමා තිබූ නමුත් කර්මාන්ත හා අභ්‍යන්තර වෙළෙඳාම අඛණ්ඩව වර්ධනය විය. වැඩි දියුණු කළ මාර්ග පද්ධතිය හා ජල මාර්ග ඔස්සේ ජපානයේ සියලු ප්‍රදේශවල ප්‍රවාහන පහසුකම් සතුටුදායක විය. නිෂ්පාදිත භාණ්ඩ හා කෘෂිකාර්මික නිෂ්පාදන ශීඝ්‍ර ලෙස හුවමාරු වීම ධනවාදි අර්ථ ක්‍රමය වර්ධනය වීමට හේතු විය. සහල් වෙළෙන්දෝ මූල්‍ය සමාජයේ ඉතා වැදගත් ස්ථානයක වැජඹුණහ. තම ආයතනයේ සිට දිනපතා සහල් මිල පිළිබඳ නිවේදන නිකුත් කිරීම සහ වාණිජ කටයුතු සඳහා ණය සැපයීම වැනි ඔවුන් විසින් ඉටු කරන ලද කාර්යභාරයන් නූතන කොටස් වෙළෙඳ පොළ සිහි ගන්වන සුළු විය. රටේ මධ්‍යම ප්‍රදේශයේ නගර වර්ධනය විය. 18 වැනි සියවස අවසන් වන විට එක් මිලියනයක් ජනතාව වාසය කළ ටෝකියෝව එකල ලොව පැවති විශාලතම නගරය බවට පත් වී තිබිණි.

## ටොකුගාවා අවධියේ සමාජය

ටොකුගාවා ෂෝගුන්වරුන් යටතේ ජපානයේ සමාජය මහත් වූ විපර්යාසයකට ගොදුරු විය. යුරෝපයේ වැඩවසම් අවධියේ සේනාපතිවරුන් බඳු වූ නයිට්වරුන්ගේ තත්ත්වය ජපානයේ වැඩවසම් ක්‍රමය තුළ සමූරායිවරුන් විසින් දරන ලදී. එකල සමූරායිවරුන්ට යුද සේවය සපයන ලද හමුදා ප්‍රධානින් වූ "ඩයිමියෝවරුන්ගේ"

පෙළපතකට අයත් ටොකුගාවා ෂෝගුනේට්ගේ පාලනය යටතේ සමුරායිවරු බෙහෙවින් නොවැදගත් තත්ත්වයකට පත් වූහ. සමාජයේ ඉහළ මට්ටමක සිටි සමුරායිවරුන් පහළ මට්ටමකට ඇද වැටුණ අතර පහළ මට්ටමක සිටි ඩයිමියෝවරුන් පාලකයන් බවට පත් වීම සමාජයේ පුළුල් විපර්යාසයක් ඇති කිරීමට හේතු විය.

## ටොකුගාවා අවධියේ සමුරායිවරුන්ගේ තත්ත්වය

- ටොකුගාවා ෂෝගුනේට්ගේ දැඩි සංකේන්ද්‍රගත බලය සහිත දේශපාලනික අධිකාරියක් සමඟ ආර්ථික වර්ධනය ද එකට ඇඳී තිබූ බැවින් යුද ශිල්පයේ විශේෂඥයන් වූ සමුරායිවරුන්ගේ තත්ත්වය පහත වැටිණි.
- ෂෝගුන්වරුන් හැකිතාක් දුරට රටේ පැවති ආරවුල් සංසිඳවා ලූ බැවින් සමුරායිවරුන්ට තම වෘත්තිය පිළිබඳ ව පුහුණු වීමට පවා අවස්ථාවක් නොමැති විය.
- මෙම අවධියේ විදේශීය යුද්ධ කිසිවක් හෝ ඇති වූයේ නැත. එබැවින් සමුරායිවරුන්ට ඉදිරියට ඒමට කිසිදු අවස්ථාවක් හෝ නො ලැබිණි.
- මෙම තත්ත්වය යටතේ සමුරායිවරු ගෞරවාන්විත පරපුටුවන් කොටසක් බවට පත් වූහ.
- ඔවුන් ටොකුගාවා යටතේ බොහෝ විට පරිපාලන කටයුතු සඳහා යොදවා ගැනිණි.

එපරිද්දෙන් කලින් සමාජයේ ඉහළින් ම වැජඹුණා වූ සමුරායිවරුන් නව ක්‍රමය යටතේ ඩයිමියෝවරුන්ගේ යටහත් සේවකයන් බවට පත් වෙද් දී සමාජ පිරමීඩයේ පහළ ස්ථරයක සිටි චෙළෙන්දෝ ද ධනය එකතු කොට ගෙන සමස්ත ආර්ථිකය කෙරෙහි බලපෑම් කළ හැකි පිරිසක් බවට පත් වූහ. වේගයෙන් දියුණුවන නාගරික සමාජයේ මධ්‍යම පංතික ස්වරූපය නිරූපණය වූයේ මොවුන්ගෙනි.

## ටොකුගාවා අවධියේ ගොවි ජනතාව

මෑතක් වන තුරු ම ඉතිහාසඥයන් විශ්වාස කෙළේ ෂෝගුන් පාලන සමයේ ගොවි පන්තිය අන්ත පීඩාවට පත් වූ බව යි. එහෙත් පර්යේෂණවලින් හෙළිදරව් වී ඇති පරිදි ගොවීන්ගේ ශ්‍රමය ඉහළ පංතිවල නිලධාරී පැලැන්තියට අත්‍යවශ්‍ය දෙයක් බවට පත් වී තිබිණි. එබැවින් ඔවුන්ට එතරම් අසාධාරණයක් හෝ පීඩා හෝ සිදු නොවූ බව පිළිගනු ලැබේ. එහෙත් ගොවි පංතිය පීඩාවට පත් වූ අවස්ථා ද නොතිබුණා ම නො වේ. යුද අවි දැරීම ගොවීන්ට තහනම් වූ බැවින් ඔවුහු යුද සේවයෙන් නිදහස් වූහ. ටොකුගාවා ඉයේෂු පාලකයා වීමෙන් පසු දිගට ම පැවතියේ සාම කාලයකි.

## ටොකුගාවා අවධියේ කෘෂිකර්මය සහ කර්මාන්ත

- මීට පෙර කාලවල නුවූ විරූ අන්දමට ටොකුගාවා ෂෝගුන්වරුන් යටතේ කෘෂිකර්මය දියුණු විය.
- වගා කළ බිම් ප්‍රමාණය දෙගුණයක් විය.
- නව බෝග වර්ග හඳුන්වා දුනි.
- පොහොර යෙදීම හා කෘෂිකාර්මික කටයුතු සඳහා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ භාවිත කිරීම නිසා ඵලදාව සීඝ්‍රයෙන් ඉහළ ගියේ ය.
- කෘෂිකර්මය මෙන් ම කර්මාන්ත ග්‍රාමීය මට්ටමෙන් දියුණු විය. සේද, කපු රෙදි, ලුණු, දුම්කොළ හා සීනි ග්‍රාමීය මට්ටමින් දියුණු වූ කර්මාන්ත අතර විය.

ජපානයේ බිහි වූ ප්‍රධාන නගර වන ඒඩෝ (ටෝකියෝ) ඔසාකා, කියෝතෝ යන නගර කේන්ද්‍ර කොට ගෙන සමාජය හා සංස්කෘතිය සැලකිය යුතු වෙනසකට භාජනය විය. මුදල් හදල් යහමින් තිබූ නගරවාසීහු සංස්කෘතික කටයුතු සඳහා ධනය වැය කළ අතර ඒ සඳහා සුදුසු වාතාවරණයක් ද ඇති කළහ.

## ටොකුගාවා ෂෝගුන් පාලනය අවසන් වීම

ක්‍රි.ව. 1867 දී ෂෝගුන් පාලනය අවසන් විය. ඉන් පසු ජපානයේ විප්ලවකාරී වෙනස්කම් රැසක් ඇති විය. ටොකුගාවා ෂෝගුන් සමයේ ඓතිහාසික වැදගත්කම තක්සේරු කිරීම තරමක් දුෂ්කර ය. මේ පාලන සමයේ වැදගත් ම ලක්ෂණය වූයේ ජපානයේ වැඩි කොටසක් ෂෝගුන්වරුන්ගේ ඒකීය පාලනයට නතු වීම යි. එසේ ම මේ පාලන කාලය තුළ දීර්ඝකාලීන සාමයක් පැවතීම සහ ආරක්ෂිත භාවය තිබීම සුවිශේෂී ලක්ෂණයක් විය. සමාජය පංතිවලට බෙදා තිබුණ ද එය එතරම් දැඩි නොවී ය. සමාජය බොහෝ දුරට සමජාතීය විය. සන්නිවේදන ජාල පුළුල් විය. අධ්‍යාපනය සීඝ්‍ර වෙනසකට භාජනය විය. සාක්ෂරතාව පිරිමින්ගේ 45% ක් ද කාන්තාවන්ගේ 15% ක් ද විය.

ජපානය නූතන රාජ්‍යයක් බවට පරිවර්තනය වීමේ පදනම දමන ලද්දේ ටොකුගාවා ෂෝගුන් පාලන කාලයේදී ය. ඇතැම් ජපන් ඉතිහාසඥයෝ ෂෝගුන් සමය ජපාන ඉතිහාසයේ ස්වර්ණමය යුගයක් ලෙස සලකති.